Department of Education, Sabaragamuwa Province/ Weekly School

**නිපුණතාවය 6.0 :** ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

**නිපුණතා මට්ටම 6.2 :** තෝරාගත් දේශීය කලා කරුවන්ගේ නිර්මාණ රසාස්වාදය කරයි.

**පාඩම 6.2.2 :** 20 වන සියවසේ ශ්‍රී ලාංකීය ආගමික සිතුවම් අගයමු.

- **එම්. සාර්ලිස්**
- **සෝලියස් මැන්දිස් (සොයිලියස් මැන්දිස්)**
- **සෝමබන්දු විද්‍යාපති**

❖ **ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට <u>වඩාත් යෝග්‍ය</u> පිළිතුර පහත සඳහන් A,B,C,D,E යන රූප සටහන් ඇසුරෙන් තෝරන්න.**

A



B



C



D



E



**[01] A අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ,**

1. යුරෝපීය ක්‍රමවේද භාවිතා කරමින් ඇඳ නැත.
2. රාජකීයයන්ගේ වස්ත්‍රාභරණ ආදිය ලාංකීය ඌරුවකින් ඇඳ ඇත.
3. සිදුහත් කුමරුන්ගේ හා යශෝධරාවගේ විවාහෝත්සවය නිරූපණය කර ඇත.
4. පොතුපිටිය පූජාරාමයේ ඇඳ ඇත.
5. ආකාශ පර්යාලෝකයෙන් නිරූපිතය.

**[02] B අක්ෂරයෙන් දැක්වෙන්නේ නව කැළණි විහාරයේ සිතුවමකි. එය අඳින ලද්දේ,**

1. එම්. සාර්ලිස් විසින්ය.
2. සෝලියස් මැන්දිස් විසින්ය.
3. රිචඩ් හෙන්රිකස් විසින්ය.
4. සෝමබන්ධු විද්‍යාපති විසින්ය.
5. හෙන්රි ධර්මසේන විසින්ය

**[03]** **C අක්ෂරයෙන් දැක්වෙන සිතුවම පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වන්නේ ,**

1. නව කැළණි විහාර සිතුවමකි.
2. ශ්‍රී ලංකාව හා සම්බන්ධ බුද්ධ චරිතයේ අවස්ථාවකට නිදර්ශනයකි.
3. සිතුවමේ කේන්ද්‍රීය රූපය වන්නේ සුමන සමන් දිව්‍ය රාජයා ය.
4. ප්‍රධාන රූප ආලෝකවත්ව හා සෙසු රූප අඳුරු පැහැයෙන් දක්වා ඇත.
5. මානව රූප බෙහෙවින් ලාලිත්‍යමය අයුරකින් ඇඳ තිබේ.

**[04]** **D අක්ෂරයෙන් දැක්වෙන්නේ සෝමබන්දු විද්‍යාපතිගේ සිතුවමකි. එය,**

1. රේඛාව කේන්ද්‍රීයව ගොඩ නගා ඇත.
2. සීතල වර්ණ මාලාවකින් පරිවාර රූප ඇඳ ඇත.
3. ප්‍රධාන රූප යුගලය අඳුරු වර්ණ වස්ත්‍රාභරණයෙන් සරසා ඇත.
4. සිදුහත් කුමරු ගේ රූපය පද්මපාණි බෝසතුන්ගේ රූපය සිහි කරයි.
5. මොහු බෞද්ධ කලා සිත්තරකු වශයෙන් හැඳින්විය නොහැකිය.

**[05]** **එම්. සාර්ලිස් ශිල්පියාගේ මෙම සිතුවමේ [D] ලක්ෂණ අතර ,**

1. පර්යාලෝක මූලධර්ම දැකිය නොහැක.
2. කියරෝස්කුරෝ සිද්ධාන්තය බෙහෙවින් යොදා ගෙන ඇත.
3. දීප්තිමත් සුදු වර්ණය ප්‍රධාන වශයෙන් දැකිය හැකිය.
4. සතරවරම් දෙවිවරුන්ගේ රූප ප්‍රබලවම මතුකර දක්වා ඇත.
5. මහනුවර සිතුවම් සම්ප්‍රදායට තරමක් නැකම් කියයි.

❖ **පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

1. එම්. සාර්ලිස් සිත්තරා චිත්‍ර පුහුණුව ලැබුවේ කුමන ශිල්පියකු යටතේද ?
2. සෝලියස් මැන්දිස් ගේ සිතුවම් අතර කැපී පෙනෙන වර්ණය වූයේ කුමක්ද ?
3. මානව රූප විශාල ප්‍රමාණයක් දැක්වෙන ‘මහියංගනයට වැඩම කිරීම’ සිතුවමේ කේන්ද්‍රීය රූපය කුමක්ද ?
4. **‘නන්දලාල් බෝස්’** යටතේ ඉන්දියාවේ ශාන්ති නිකේතනයෙන් සිතුවම් අධ්‍යාපනය හැදෑරූ ලාංකීය නූතන බෞද්ධ කලා සම්ප්‍රදාය නියෝජනය කළ ශිල්පියා කවුද?
5. බෙල්ලන්විල විහාරයේ ඇඳ ඇති බෞද්ධ සිතුවමක් නම් කරන්න.

## <u>දෙවන කොටස - චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය</u>

1) එම් සාර්ලිස් ගේ සිතුවම් පිළිබඳව ඇගයීමක් කරන්න

2) සෝලියස් මැන්දිස්ගේ නව කැලණි විහාර සිතුවම් රේඛාව මූලික කරගනිමින් තමාගේම ශෛලියකින් ඇඳ තිබේ.ඔහුගේ සිතුවම් ඇසුරෙන් විමසන්න.
3) ‘’විසිවන සියවසේ ශ්‍රී ලාංකීය නූතන බෞද්ධ කලාවට නව මුහුණුවරක් එක් කිරීමට සෝමබන්දු විද්‍යාපති ශිල්පියා සමත් වී ඇත.’’
   - **ඔහුගේ චිත්‍ර කලා ප්‍රවේශය**
   - **තේමාවල සුවිශේෂීතාව**
   - **ශෛලීය හා ශිල්ප ක්‍රම ,** ඔහුගේ සිතුවම් ඇසුරින් පහදන්න.